දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක : 05/2016

මගේ අංකය : ඩී1/විවිධ/2016,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2016/01/25

බන්ධනාගාර මූලස්ථානයේ සියළුම මාණ්ඩලික නිලධාරීන්,
සියළුම බන්ධනාගාර අධිකාරීවරුන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීවරුන් වෙත,

ගරු අමාත්‍යවරුන්ට හා අමාත්‍යාංශ ලේකම්තුමන්
<u>වෙත කෙරෙන ආරාධනා, නිලනාමය සහ තනතුර භාවිතා කිරීම සම්බන්ධ</u>

පූර්ව අනුමැතියකින් තොරව, රේඛීය අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාගේ, නියෝජ්‍ය අමාත්‍යතුමාගේ, ලේකම්තුමාගේ හෝ වෙනත් අමාත්‍යාංශයක අමාත්‍යවරයෙකු, නියෝජ්‍ය අමාත්‍යවරයෙකු හෝ වෙනත් මාණ්ඩලික නිලධාරියෙකුගේ නම් ඇතුළත් කර ආරාධනා පත්‍ර, සමරු පලක, දැන්වීම් හෝ සමරු ප්‍රකාශ මුද්‍රණය කරන බව නිරීක්ෂණය වේ.

02. එබැවින්, මින් ඉදිරියට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු, නිලධාරීන්ගෙන් සමන්විත සංගමයක්, සමිතියක් හෝ බන්ධනාගාර ආයතනයක්, විධිමත් පරිදි ලිඛිත අනුමැතියකින් තොරව, රේඛීය අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාගේ, නියෝජ්‍ය අමාත්‍යතුමාගේ, ලේකම්තුමාගේ හෝ වෙනත් අමාත්‍යාංශයක අමාත්‍යවරයෙකු, නියෝජ්‍ය අමාත්‍යවරයෙකු හෝ වෙනත් මාණ්ඩලික නිලධාරියෙකුගේ නම් ඇතුළත් කර ආරාධනා පත්‍ර, සමරු පලක, දැන්වීම් හෝ සමරු ප්‍රකාශ මුද්‍රණය කිරීම හෝ කිසිදු මාධ්‍යයක් මඟින් ප්‍රකාශයට පත් කිරීම නොකළ යුතුය.

03. එසේ රාජකාරිමය වශයෙන් ආරාධනා පත්‍ර, සමරු පලක, දැන්වීම් හෝ සමරු ප්‍රකාශ මුද්‍රණය කිරීමක් සිදු කිරීමට අවශ්‍ය වූ විටක පහත පරිදි විධිමත් පූර්ව හෝ ලිඛිත අනුමැතිය ලබාගත යුතු ය.

- බන්ධනාගාර ආයතනයක කටයුත්තක් නම්, ආයතනය භාර බන්ධනාගාර අධිකාරීවරයා විසින් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් දැනුවත් කර, නම ඇතුලත් කරනු ලබන අදාළ නිලධාරියාගෙන් විධිමත් පරිදි ලිඛිත අනුමැතිය ලබාගත යුතුය.
- කිසියම් නිලධාරියෙකු විසින් සිදු කරනු ලබන ස්වකීය කටයුත්තක් (පොත්පත් මුද්‍රණය කිරීම ආදිය) නම්, අදාළ නිලධාරියා සේවය කරන බන්ධනාගාර ආයතනයේ බන්ධනාගාර අධිකාරි මඟින් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් දැනුවත් කර, නම ඇතුලත් කරනු ලබන අදාළ නිලධාරියාගෙන් විධිමත් පරිදි ලිඛිත අනුමැතිය ලබාගත යුතුය.

- නිලධාරීන්ගෙන් සමන්විත සංගමයකට හෝ සමිතියකට අදාළ කටයුත්තක් නම් අදාළ සංගමයේ හෝ සමිතියේ සභාපති හෝ ලේකම් විසින් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් දැනුවත් කර, නම ඇතුලත් කරනු ලබන අදාළ නිලධාරියාගෙන් විධිමත් පරිදි ලිඛිත අනුමැතිය ලබාගත යුතුය

03. තවද, බන්ධනාගාර ආයතනයක්, සංගමයක්, සමිතියක් හෝ සේවය කරනු ලබන නිලධාරියෙකු විසින් පවත්වන්නා වූ උත්සවයක් හෝ වැඩ සටහනක් ආදි වූ කටයුත්තක, න්‍යාය පත්‍රය හෝ වැඩ සටහන් පෙළ ගැස්ම සහ ආරාධිතයන්ගේ නාමලේඛනය බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කර විධිමත් පරිදි ලිඛිත අනුමැතිය ලබාගත යුතුය.

04.මෙම නියෝග පැහැර හරින නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බව ද දන්වා සිටිමි. ඉහත කරුණු ඔබ ඇතුළු සෙසු සියළුම නිලධාරීන් හට බලාත්මක වන අතර, මේ සම්බන්ධයෙන් ඔබ අංශයේ/ආයතනයේ සේවය කරන සියළුම නිලධාරීන් දැනුවත් කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

එච්.එම්.එන්.සී.ධනසිංහ

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

.එම්.එන්.සී. ධනසිංහ
නාගාර කොමසාරිස් ජ...ල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.